(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 90.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 මැයි මස 06 වැනි සිකුරාදා අ. භා. 1.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0288/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ වත්මන් සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද;

(iv) රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ සහ කාර්ය මණ්ඩලයේ වත්මන් සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0813/'10

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක කවරේද;

(ii) එම අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0874/'10

3.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලංකාව ඉරානයෙන් ලබා ගත් ණය ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වර්ෂවලදී ඉරානය, ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන අරමුදල යන ආයතනවලින් ලබා ගත් ණය මුදල් යෙදවූ ව්‍යාපෘති කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘති සඳහා යෙදවූ මුදල් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ණය මුදල්වලින් ව්‍යාපෘති සඳහා නොයෙදවූ දැනට භාණ්ඩාගාරය සතුව ඇති ප්‍රමාණය කොපමණද;

(v) ඉහත (ii) හි සඳහන් එක් එක් ආයතනයට හෝ රටට ගෙවීමට ඇති ණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම ණය ප්‍රමාණයන් ගෙවීමට දී ඇති කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0891/'10

4.

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැප්පෙටිපොල විශේෂ ආර්ථික මධ්‍යස්ථානය ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වැලිමඩ එළවලු ගොවීන් අසීරු තත්ත්වයට පත්ව ඇති බවත්;

(ii) තම එළවලු සඳහා හොඳ මිලක් නොලැබීම මෙන්ම තම නිෂ්පාදන සඳහා නිසි පරිදි මුදල් නොගෙවීම හේතුවෙන් මෙම ආර්ථික මධ්‍යස්ථානය ගොවීන්ගේ විශ්වාසනීයත්වය ගිලිහී ගිය ස්ථානයක් බවට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය මග හරවා වෙළෙන්දා හා ගොවියා අතර ගැටලු මතු නොවන, ගොවීන් තුළ ආර්ථික මධ්‍යස්ථානය පිළිබඳව විශ්වාසය වර්ධනය කළ හැකි වැඩ පිළිවෙළක් සකස් කර, ක්‍රියාත්මක කිරීමටත්;

(ii) මෙම ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳසැල් පරීක්ෂා කිරීම සඳහා මිල පාලන ඒකකය හා කිරුම් මිනුම් ඒකකයේ සහය ලබා ගෙන ගොවීන් සූරා කෑම අවුරාලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටත්;

කඩිනමින් කටයුතු කරන්නේද, යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0923/’10

5\.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැයෙන් දේශීය හා විදේශීය වශයෙන් සපුරා ගන්නා ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1010/’10

6\.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් ආරක්ෂක සංඥා හෝ ගේට්ටු යොදා නොමැති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එවැනි අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග පැවතීම නිසා 2009 වසර තුළ සිදුවූ අනතුරු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගයන්හි ඇති අනතුරුදායක තත්ත්වය වළකා ජනතාවගේ ආරක්ෂාව තහවුරුකරලීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකසා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1016/’10

7\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වාර්තා වූ “ක්ෂයවීම” යන මන්දපෝෂණ තත්ත්වයට ගොදුරු වී ඇති ළදරුවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) ළදරුවන් අතර පවතින ක්ෂයවීම නැමැති මන්ද පෝෂණ තත්ත්වය අඩුකිරීම සඳහා රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග ඉහත මන්දපෝෂණ තත්ත්වය අඩුකිරීම සඳහා ප්‍රමාණවත්වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1088/'11

8.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වාහන විමෝචන පරීක්ෂණ (Green Test) වැඩසටහන යටතේ 2009 වර්ෂය තුළ කොළඹ දිස්ත්‍රික්කයේ පරීක්ෂා කරන ලද වාහන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ හා අනෙකුත් දිස්ත්‍රික්ක තුළ වායු දූෂණය අඩු කිරීම සඳහා මෙම පරීක්ෂණ වැඩසටහනේ දායකත්වය පිළිබඳව පරීක්ෂණාත්මක සාක්ෂි තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0315/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) අයිෆා උළෙල කොළඹදී පැවැත්වීමට ශ්‍රී ලංකාව එකඟතාවකට පැමිණියේ කවදාද;

(ii) එම උළෙල සඳහා කරන ලද වියදම් සඳහා ගෙවීම් කරන පාර්ශ්වය කවරෙක්ද;

(iii) ඒ සඳහා මුදල් ලැබුනු දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ආකාරයට මුදල් ගෙවීම සිදු කරනු නොලබන්නේ නම්, අදාළ වියදම පියවනු ලබන්නේ කවරෙක්ද;

(v) උළෙල සඳහා වැය වූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අයිෆා උළෙල තුළින් ලබා ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ කවරේද;

(ii) එවැනි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0815/'10

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දෙවිනුවර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0893/'10

11.

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින ප්‍රධාන පාසල්වල සිසු දරුවන්ට අධ්‍යයන නිවාඩු (Study Leave) නමින් නිවාඩු ලබාදෙන බවත්;

(ii) අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට වාර අවසානය වන විට විෂය නිර්දේශයට අයත් පාඩම් මාලා අවසන් කළයුතු වුවත්, අදාළ විෂය භාර ගුරුවරුන් විසින් පාසල් කාල සීමාව තුළදීම උපකාරක පන්ති (Tuition Classes) පවත්වන බවත්;

(iii) එම පන්ති පැවැත්වීම සඳහා ඉහත සඳහන් කළ පරිදි 'අධ්‍යයන නිවාඩු' ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පරිදි නිවාඩු ලබාදීමට අනුමත කර ඇත්තේ කවුරුන් විසින්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 'අධ්‍යයන නිවාඩු' ලබාදෙමින් පාසල් කාල සීමා තුළ පන්ති නොපවත්වා එකී කාල සීමාව තුළම මුදලට අමතර පන්ති පවත්වන රජයේ පාසල් ගුරුවරුන් පිළිබඳව සොයා බලා ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0924/'10

12.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප විදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැයෙන් දේශීය හා විදේශීය වශයෙන් සපුරාගන්නා ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන්;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(iii) සම්පූර්ණ පිරිවැය ප්‍රමාණයෙන් ණය මුදල් වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(iv) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්;

(v) එම ණය මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොලී ප්‍රමාණය සහ ණය මුදල් පියවීමේ කාල සීමාව;

(vi) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමවේදය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1011/'10

13.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලාංකීය කාන්තා ජනගහනයෙන් විදේශ රැකියාවල නිරත වී සිටින කාන්තාවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) මේ දක්වා විදේශ රැකියාවල යෙදී සිටින අතරතුර ජීවිතක්ෂයට පත්ව ඇති කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එවැනි මරණ අවම කරගැනීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග එක්ව සැකසූ වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/'10

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ උද්ධමනය ගණනය කිරීමට යොදාගන්නා වත්මන් ක්‍රමවේදය සෑහිමකට පත්විය හැකි මට්ටමක පවතින්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උද්ධමනය පාලනය කිරීමට වර්තමානයේ රජය විසින් ගනු ලබන පියවර කවරේද;

(ii) එම පියවර මගින් ප්‍රමාණවත් අන්දමින් උද්ධමනය පාලනය වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1089/'11

15.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වන සෙනසුන වැඩසටහන යටතේ වන සෙනසුන් ඇති කිරීම සඳහා සුදුසු ජෛව විවිධත්ව හා සංස්කෘතික වටිනාකමකින් යුක්ත වන ප්‍රදේශ ලෙස මේ වනවිට හඳුනාගත් ස්ථාන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන යටතේ අලුතින් වන සෙනසුන් ඇති කිරීමට පියවර ගත් ස්ථාන කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 01, 02, 03, 04 සහ 05 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 20(7) දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7(1) හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2011 මැයි මස 25 වැනි බදාදා සහ මැයි මස 26 වැනි බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුව රැස්වන දිනයන් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2011 මැයි මස 25 වැනි බදාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 5/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'10

2.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කල්මුනේ නගරය තුළ පිහිටි සන්දන්කර්නි මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම,— දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ගේ විවිධ වූ ක්‍රීඩා කුසලතාවයන් හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා උසස් තත්වයේ පහසුකම් සපයාදීමේ අදහසින් කල්මුනේ නගරය තුළ පිහිටි සන්දන්කර්නි මහජන ක්‍රීඩාංගනය සියලු පහසුකම් සහිත ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'10

3.

ගරු අජිත් කුමාර මහතා,— අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීම,— සමාජයෙහි ව්‍යාප්තව යමින් පවතින අපරාධ අඩු කිරීමත්, අපරාධ නීති පද්ධතියේ පවතින අඩුපාඩු අඩුකර අපරාධ නීතිය සංශෝධනය කිරීමත්, අධිකරණය තුළ ගොඩගැසී ඇති ඉඩම් නඩු ඇතුලු නඩු විභාග අවසන් කිරීම හා අධිකරණය, පොලිසිය හා බන්ධනාගාර නවීකරණය කර කඩිනම් සේවයක් ලබා දීම සඳහාත් අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/'10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආබාධිත හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට වෘත්තීය පුහුණුව ලබාදීම,— ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වෘත්තීය පුහුණුවක් දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ලබා දී එම දරුවන් වඩාත් විධිමත් ආකාරයෙන් රැකියා අවස්ථාවලට යොමු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 97/'10

5.

ගරු රුවන් රණතුංග මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා වන වාර්ෂික පොලී අනුපාතය 14% ක් ලෙස වැඩි කිරීම,— සංස්ථා, මණ්ඩල, අධිකාරී සහ පෞද්ගලික අංශය තුළ රට වෙනුවෙන් සැලකිය යුතු මෙහෙවරක් ඉටුකොට දැනට ජීවිතයේ සැඳෑ සමය ගෙවන බොහෝ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තමන්ගේ රැකියාවෙන් ඉතිරි කරගත් මුදල් හා අර්ථසාධක අරමුදල් ස්ථාවර තැන්පතුවල යොදවා ඊට ලැබෙන පොලියෙන් වර්තමානයේ ජීවත් වන අතර, රජයේ බැංකුවල වාර්ෂික පොලී අනුපාත 10.5% දක්වා අඩුකිරීම නිසා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබෙන පොලී ආදායම පහත වැටීම හේතුවෙන් ඔවුන් දැඩි අසීරුතාවයකට පත්ව සිටින බැවින්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් ලක්ෂ 15 හෝ ඊට අඩු ස්ථාවර තැන්පතු වෙනුවෙන් වාර්ෂික පොලී අනුපාතය 14% ක් ලෙස වැඩි කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/'10

7.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100 කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

11.

ගරු රවී කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

15.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

16.

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

17.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

18.
ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'10

19.
ගරු රවී කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

20.
ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

21.
ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

22.
ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

23.
ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

24.
ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

25.
ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

26.
ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

27.
ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

28.
ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

29.
ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

30.
ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

31.
ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

32.
ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස්

කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

33.
ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'10

34.
ගරු අජිත් කුමාර මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'10

35.
ගරු අජිත් කුමාර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අඳ ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අඳ ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අඳ ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අඳ ගොවීන්ට වූ එම අසාධාරණය දුරැලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'10

36.
ගරු අජිත් කුමාර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

37.
ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

38.
ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන්

සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

39.

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

40.

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

41.

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

42.

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'10

43.

ගරු අජිත් කුමාර මහතා,— ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම වටිනා ස්වාභාවික සම්පත් ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරය, කන්නෙලිය රක්ෂිත වනාන්තරය, රුමස්සල කන්ද, කොග්ගල ඔය දූපත් හා කඩොලාන පද්ධතිය, රම්සා තෙත් බිමක් වන මාදු ගඟ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'10

44.

ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,— සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ජන සහභාගීත්වය ඇතිව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'10

45.

ගරු තිලංග සුමතිපාල මහතා,—කොළඹ නගරයේ වැසි ජලය බැස යාම ක්‍රමවත් කිරීම,— කොළඹ නගරයේ තවමත් පවතින්නේ වසර 100 කටත් වඩා පැරණි ජලය බැස යන කාණු පද්ධතියක් වන අතර එය නිසියාකාරව ක්‍රියාත්මක නොවන බැවින් පැය භාගයක පමණ අඛණ්ඩ වර්ෂාවකින් කොළඹ නගරයම ජලයෙන් යටවන තත්ත්වයකට පත්ව ඇති හෙයින්ද, අවිධිමත්

ලෙස ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි හා අනවසර ඉදිකිරීම්වලින් පරිසරයට හානි සිදුවන හෙයින්ද, අධික වැසි අවස්ථාවලදී කොළඹ නගර සහා බල ප්‍රදේශය තුළ ඇතිවන ගංවතුර ආපදා තත්ත්වය අවම කිරීම සඳහා වැසි ජලය ක්‍රමවත්ව බැස යාමට හැකිවන පරිදි අදාළ කාණු පද්ධතිය නවීකරණය හා ශුද්ධ පවිත්‍ර කර විධිමත්ව පවත්වාගෙන යා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'10

46.

ගරු තිලංග සුමතිපාල මහතා,— වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම,—දේශීය හා ජාත්‍යන්තර වෛද්‍ය ක්‍රමය තුළ වෘත්තීමය සුදුසුකම් හා අත්දැකීම නොමැති වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් ප්‍රතිකාර කිරීමෙහි යෙදී සිටීම තුළින් සාමාන්‍ය රෝගී ජනතාවට විශාල ගැටලු වලට මුහුණ පෑමට සිදුවීමෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇති හෙයින් ද, ඒ තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් සමාජය තුළ අවමානයට පත්ව ඇති හෙයින්ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීමට, ක්‍රමවත්ව හා විධිමත්ව නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'10

47.

ගරු තිලංග සුමතිපාල මහතා,— මාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කර ඇති හෙයින් ද, තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද, ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබාගැනීමේ අවකාශය ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'10

48.

ගරු තිලංග සුමතිපාල මහතා,—ක්‍රීඩාව තුළින් නිරෝගීමත් සමාජයක් නිර්මාණය කිරීම,— ළමා අවධියේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම තුළින් නිරෝගීමත් සමාජයක් බිහිකිරීමටත්, සහජ කුසලතා ඇති දරුවන් ජාත්‍යන්තර තලයට යොමු කිරීමටත්, ලොව සුපතල ක්‍රීඩකයින් බිහි කර රටට කීර්තියක් ලබා ගැනීමටත් හැකිවන පරිදි ජාති භේදයෙන් පන්ති භේදයෙන් තොරවූ සාධාරණ ක්‍රම වේදයක් රාජ්‍ය මට්ටමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

49.

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

50.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

51.

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී

සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

52.
ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

53.
ගරු රවී කරුණානායක මහතා, — ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

54.
ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'10

55.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කාදී අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම,— 1929 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත යටතේ කාදී අධිකරණ පද්ධතිය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ අතර ඉන් පසුව 1951 දී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ සංශෝධනය කරන ලද එම ආඥාපනත මුස්ලිම් පවුල්වල පැනනගින ගැටලු පිළිබඳ සියළුම කාරණා සම්බන්ධ තීරණයන් ගැනීමට කාදී විනිශ්චකාරවරුන්ගේ බල තල වැඩිකළ යුතු අතර එම පද්ධතියේ ගෞරවයට නිසි තැන ලබා දෙමින් නඩු විභාග වාර නිසි පරිදි පැවැත්වීමට කාදී අධිකරණ පද්ධතියේ තත්ත්වය උසස් කළ යුතු බව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාදී විනිශ්චකාරවරුන් පත්කරන බැවින් සෙසු අධිකරණ නිලධාරීන් හට හිමි වන ගරුත්වය හා පිළිගත් වැටුප් තලය මත ස්ථාන ගත කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

56.
ගරු රවී කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/'10

57.
ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට

විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියළුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

58.

ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිලිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'10

59.

ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'10

60.

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'10

61.

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

62.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

63.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි

පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

64.

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

65.

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

66.

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

67.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

68.

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි හව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

69.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල

කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

70.
ගරු බුද්ධික පතිරණ මහතා,— සියළුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

71.
ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

72.
ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

73.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියළුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

74.
ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

75.

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

76.

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දුරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

77.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

78.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

79.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

80.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

81.
ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

82.
ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

83.
ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

84.
ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

85.
ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/’10

86.
ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/’10

87.
ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 104/’10

88.
ගරු. (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා,— තල් ගස් වගාව දිරිමත් කිරීම,— ‘‘කප්පගතරු’’ යන නමින් හැඳින්වෙන පොදු ජනතාවට ඉමහත් ප්‍රයෝජනවත් වන තල් ගස් වගාව දිරිමත් කිරීමෙන් තල් ආශ්‍රිත නිෂ්පදන ප්‍රවර්ධනයට සියලු පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/’10

89.
ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/’10

90.
ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/’10

91.
ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/’10

92.
ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව

නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

93.
ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

94.
ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

95.
ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

96.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

97.
ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

98.
ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

99.

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

100.

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

101.

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

102.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'11

103.

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය බැංකුවල පොලී ගෙවීම සහ පොලී අයකිරීම අතර පවතින පරතරය අඩු කිරීම,— රාජ්‍ය බැංකුවල සාමාන්‍ය ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 4 % සිට 4.5 % දක්වාද ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 8 % පමණ ද වන අතර බැංකු විසින් නිවාස, ව්‍යාපාරික සහ කෘෂිකාර්මික වැනි ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතය 12 % සිට 13 % ක් ද පමණ වන බැවින් ජනතාවට සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට අතදීම සඳහාත් ඔවුන් දිරිගැන්වීම සඳහාත් මෙම අයකරන පොලිය සහ ගෙවන පොලිය අතර පවතින පරතරය අඩුකිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

104.

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරඟ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතුරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම

සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

105.

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

*106.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*107.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*108.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*109.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*110.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*111.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*112.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*113.

පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*114.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා,— සත්ව පනත යටතේ නියමය,— 1958 අංක 29 දරන සත්ව පනතේ 3, 3අ, 11, 26 හා 34 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*115.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*116.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*117.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

118.

සමනලගිරි සතරාංග (නාඩි) වෛද්‍ය සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0199/’10

1.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0200/'10

2.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0201/'10

3.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0202/'10

4\. ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0203/'10

5\. ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0204/'10

6.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව ආරම්භයේ දී කොමිෂන් සභාව සතු වූ මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මේ වන විට විකුණා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එයින් අක්කර 5 ට වැඩි විකුණුම්වල ඉඩමේ නම, ප්‍රමාණය, විකුණූ දිනය, ගැනුම්කරු සහ විකුණූ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉතිරි ඉඩම්වලින් කිසිවක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබාදුන් ඉඩමේ නම, බදු ගැනුම්කරු හා ලබාදුන් දිනය, ලබාගත් බදු මුදල සහ බදු අවසන් වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එසේ නොවිකුණා හෝ බදු නොදී ඉතිරිව ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ග්‍රාම නිලධාරී වසම් අනුව අක්කර වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?